# කලහ විවාද සූත්‍ර 2
## Quarrels & Disputes 2

My immense gratitude to the great Noble council of Akanitta brahma realm

23/02/2014

**නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො, ඉච්ඡානිදානානි පරිග්ගහානි;**
**ඉච්ඡායසන්ත්‍යා න මමත්තමත්ථි, රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා.**

**සම්ප්‍රයුක්ත නාමය ද වස්තුවාලම්බන රූපය ද නිසා ස්පර්ශය වෙයි, තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහයෝ ඉච්ඡා (=ආශා) ව නිදාන කොට ඇත්තාහු ය, ඉච්ඡාසඞ්ඛ්‍යාත තෘෂ්ණාව නැති කල්හි මමත්වය නැත්තේ ය, රූපය ඉක්මැගිය කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත්.**

## නාමරූප නිසා ස්පර්ශය

ඇස නිසාද, රූපය නිසාද, චක්ඛු විඤ්ඤාණය උපදී. ඒ තුන එක්වීමෙන් ස්පර්ශය වෙයි. කණ නිසාද, ශබ්දය නිසාද ... මනස නිසාද, ධර්ම අරමුණු නිසාද, මනො විඤ්ඤාණය උපදියි. ඒ තුන එක්වීමෙන් ස්පර්ශය වෙයි. වේදනාව, සංඥාව, චේතනාව, ස්පර්ශය සහ මනසිකාරය යන මෙය නාම යැයි කියනු ලැබේ. සතර මහා භූතයින් සහ සතර මහාභූත සමූහය නිසා පවත්නා රූපය යන මෙය රූප යැයි කියනු ලැබේ.

## පරිග්‍රහයෝ ඉච්ඡා නිදාන කොට ඇත්තාහුය

'ඉච්ඡා' යි තණ්හාව කියනු ලබයි. යම් අභිජ්ඣා, රාග, ලෝභ අකුසල මූලයෙක් වේද එයයි. පරිග්‍රහයෝ දෙදෙනෙකි (a) තණ්හාපරිග්‍රහය (b) දිට්ඨිපරිග්‍රහය. පරිග්‍රහයෝ ඉච්ඡා නිදාන කොට ඇත්තාහුය.

## ඉච්ඡා නැති කල්හි මමත්වයෝ නැත


මමත්වයෝ දෙදෙනෙකි: තණ්හා මමත්වය සහ දිට්ඨි මමත්වය. ඉච්ඡාව අවිද්‍යාමාන වන කල්හි, නැති කල්හි, නොලැබෙන කල්හි මමත්වයෝ නැත, විද්‍යාමාන නොවෙති, නොලැබෙත්.

## රූපය ඉක්මවා ගිය කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත්


රූපය - සතර මහා භූතයින් සහ සතර මහාභූත සමූහය නිසා පවත්නා රූපය.
**රූපෙ විභූතෙ** - සතර අයුරකින් රූපය ඉක්මවන ලද වෙයි; ඥාත විභූතයෙන්, තීරණ විභූතයෙන්, ප්‍රහාණ විභූතයෙන්, සමතික්‍රම විභූතයෙනි. රූපය විභූත කල්හි, ඉක්මවා ගිය කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත්.

# මෝහය කෙසේ ඇතිවන්නේද?

- රෝගී සංඥාව මගේ යැයි ගැනීමෙන් මෝහය ඇතිවේ.





- රූපය පුන පුනා ස්පර්ශ කිරීමෙන් නිත්‍ය භාවය සාදා ගනියි.





යම් මෝහයේ නැතිවීමක් ඇත්ද එය සඳහා තණ්හාවත් අවිද්‍යාවත් යන දෙකම නැතිකළ යුතුය.

- තණ්හාව සුභය යන්න සමග සම්බන්ධ වන අතර අවිද්‍යාවෙන් මෝහය ඇතිවේ.
- මෙහිදී තථාගතයන් වහන්සේ දේශනා කළ පළමුවන සහ දෙවන චතුරාර්ය සත්‍යයේ ආශ්චර්ය භාවය වැටහේ.
- අවිද්‍යාවට ඉඩදීම මගින්, තණ්හාව නිසා පටිච්ච සමුප්පන්නය ඇතිවේ.

දැන් ත්‍රිකෝණ දෙකක් පේනවා.





දිට්ඨි අනුසය ඇතිවූ පසු ලාභය සහ නන්දිය ඇතිවේ. මෙහි වෙනස කුමක්ද?

- දිට්ඨි අනුසය වීමෙන් පසුව රූපයට සුබ යැයි භාවිතා කිරීම මගින් රූපය ලාභ වශයෙන් ගනී, නන්දිය වේදනාව නිසා ඇතිවේ. වෙනස වන්නේ ලාභය රූප කොටස නිසාය. නන්දිය වේදනා කොටස නිසාය..
- දැන් ත්‍රිකෝණ දෙක දික් කරන්න;

- මෙම ත්‍රිකෝණ දෙක හමුවෙන තැන නාමරූප බව සැලකිල්ලට ගන්න.




- රෝගී සංඥාව මගේ යැයි ගැනීමෙන් මෝහය ඇතිවේ. එමගින් දකුණු ත්‍රිකෝණය සෑදේ. දකුණු ත්‍රිකෝණය මගින් වම් ත්‍රිකෝණය ඇතිවේ. මෙම ත්‍රිකෝණ දෙක නිසා නාමරූප ඇතිවේ, විඥ්ඥාණය දහරාවක් මෙන් පවත්වා තණ්හාව ඇතිවිය.
- පරිග්‍රහය නිසා මමත්වය ඇතිවිය.

**න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී, නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී;
එවං සමෙතස්ස විභොති රූපං, සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා.**

(රූපය නො වන සේ පිළිපන් හෙතෙම) ප්‍රකෘතිසංඥවෙන් සංඥ ඇත්තේ නො වෙයි, විකෘතිසංඥවෙන් විසංඥ වූයේ නො වෙයි, සංඥ විරහිත වූයේ ද නො වෙයි, ඉක්මවූ සංඥ ඇත්තේ ද නො වෙයි, මෙසේ (සංඥ සංඥිතාදිභාවයෙහි නො සිට) පිළිපන්නහුට රූපය නො වෙයි, තෘෂ්ණාදි ප්‍රපඤ්චයෝ සංඥනිදාන කොට ඇත්තාහු ම වෙත් ද එහෙයිනි.

**න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී – ප්‍රකෘති සංඥාවෙන් සංඥා ඇත්තේ නොවෙයි, විකෘති සංඥාවෙන් විසංඥ වූයේ නොවෙයි.**

- **සඤ්ඤසඤ්ඤී** – ප්‍රකෘති සංඥාවෙහි සිටි යම් කෙනෙක් වෙත් නම් ඔහු 'සඤ්ඤසඤ්ඤීහු' යැයි කියනු ලැබෙති. රූපය ඉක්මවා ගිය කල්හි ප්‍රකෘති සංඥාවෙහි නොසිටී.
- **විසඤ්ඤසඤ්ඤී** - උමතුවෝ 'විසඤ්ඤසඤ්ඤීහු' යැයි කියනු ලැබෙති. හෙතෙම උමතුවෙක් නොවෙයි.

**නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී –** සංඥා විරහිත වූයේද නොවෙයි, ඉක්මවූ සංඥා ඇත්තේ ද නොවෙයි.

- **අසඤ්ඤී** - නිරෝධයට සමවැදුනාහු ද අසඤ්ඤ සත්වයෝ ද 'අසඤ්ඤීහු' යැයි කියනු ලැබෙති.
- **විභූතසඤ්ඤී** – සතර අරූප සමාපත්ති ලාභීහු විභූත සංඥා ඇත්තේ යැයි කියත්.

**එවං සමෙතස්ස විභොති රූපං – මෙසේ පිළිපන්නහුට රූපය නොවෙයි.**

- මෙහි මහණ තෙමේ, සුඛය පහ කිරීමෙන්ද දුඃඛය පහකිරීමෙන්ද සොම්නස් දොම්නස් දෙදෙනා දුරුකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂාවගේද සිහියගේද පිරිසිදු භාවය ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. සියලු අයුරින් රූපසංඥාව ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥාව නැතිකිරීමෙන් නානත්ත සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්ත යැයි ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයි. අරූප සමාපත්තියෙන් යුක්ත වූයේ වෙයි.
- මෙසේ පිළිපන්නහුට රූපය නොවෙයි.


**සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා –** ප්‍රපඤ්චයෝ සංඥා නිදාන කොට ඇත්තාහුය

- **පපඤ්ච –** ප්‍රපඤ්චයෝ තණ්හා ප්‍රපඤ්ච, දිට්ඨි ප්‍රපඤ්ච වශයෙන් දෙයාකාර වේ. ප්‍රපඤ්චයෝ සංඥා නිදාන කොට ඇත්තාහුය, සංඥාව සමුදය කොට ඇත්තාහුය, සංඥාව ජාති කොට ඇත්තාහුය, සංඥාව ප්‍රභව කොට ඇත්තාහුය.

පස්වෙනි පිටුවට අනුව, සියලු දුක්ඛයන් ඇතිවන්නේ රූපයත්, රූපය නිසා හදන සංස්කාරත් නිසයි යන්න වැටහේ.

- රූපය නිසා කාය, වචී සහ චිත්ත සංස්කාර සාදයි.


- නිත්‍ය භාවයක් නැති නිසා, රූපයත්, රූපය නිසා වන කාය, වචී සහ චිත්ත සංස්කාර එපා යැයි පවසන්නේ 3 වන ධ්‍යාන සමාපත්තිය සහිතව සිටිය හැකිය.




**ඇයි 3 වන ධ්‍යාන සමාපත්තිය?**

- රූපයත් එය නිසා වන සංස්කාරත් එපා යැයි කියනවා නම් රූප නිසා වන වේදනා කොටස නැතිව යනවා.

- එනම් භයෙන් අගතියට යෑම සිට වේදනාව දක්වා එන නාමරූප නිසා ඇතිවන පාර කැපී යනවා.





වේදනාවත් එය නිසා වන සංස්කාරත් එපා යැයි කියනවා නම් 4 වන ධ්‍යාන සමාපත්තියට යනවා.

තුන්වන පිටුව මෙන් නැවතත් මෙනෙහි කරන්න. එනම්,

- අවිද්‍යාවට ඉඩදීම මගින්, තණ්හාව නිසා පටිච්ච සමුප්පන්නය ඇතිවේ.

පස්වෙනි පිටුවේදී, මේ නිසා නාමරූප ඇතිවන බව සාකච්ඡා කලා.





**1, 2 සහ 3 යන පාරවල් නැති කිරීමෙන් දුක්ඛය නැති වන්නේද?**

- මෙයින් නිරෝධය පමණක් ඇතිවන්නේය.
- තවමත් වේදනාව සහ පරාමාසය අතර සම්බන්ධතාවය පවතී.

**කෙසේ දුක්ඛය නැති වන්නේද?**

- 4 සහ 5 යන පාරවල් දෙකත් නැති විය යුතුය.
- මේ සඳහා අවිද්‍යාවත් මානයත් නැතිවිය යුතුය.
- සංස්කාර නොකළ යුතුය, 7 වන පිටුවේ සඳහන් පරිදි ධ්‍යාන සමාපත්ති උපදවා වාසය කළ යුතුය..




යමෙක් එසේ වාසය කළ යුතුය, එය සම්මාසමාධිය සහිත විය යුතුය.

**එතෙ ච ඤත්වා උපනිස්සිතාති, ඤත්වා මුනී නිස්සයෙ සො වීමංසී;**
**ඤත්වා විමුත්තො න විවාදමෙති, භවාභවාය න සමෙති ධීරො**

තවද තෙල දෘෂ්ටිගතිකයන් (මොහු ශාශ්වතොච්ඡේද) 'දෘෂ්ටි ඇසුරු කළාහු යැ'යි දැන, තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රයත් දැන, ඒ පණ්ඩිත වූ බුද්ධමුනි තෙම (දුඃඛානිත්‍යාදි පිසින්) ධර්මයන් දැන (අනුපාදවිමොක්ෂයෙන්) මිදුණේ විරුද්ධවාදයට නො පැමිණෙයි, ඒ ධීර තෙම පුනපුනා භවයට-ද නො පැමිණේ.

Having known, they still are dependent, knowing the sage, ponders dependencies.
On knowing them, released, he doesn't get into disputes. The enlightened one doesn't meet with existence & non-existence.

**එතෙ ච ඤත්වා උපනිස්සිතාති** - මොවුහු දෘෂ්ටි මත රඳාපවත්නා බව දැන,
දෘෂ්ටි; ශාස්වත උච්ඡෙද දෘෂ්ටි. මොවුහු දෘෂ්ටි මත රඳාපවත්නා බව දැන.

**ඤත්වා මුනී නිස්සයෙ සො වීමංසී**

- මොවුහු දෘෂ්ටි මත රඳාපවත්නා බව දැන, බුද්ධමුනි තෙම විමසා බලයි.

**ඤත්වා විමුත්තො න විවාදමෙති** - එම ධර්මයන් දැන මිදුනේ විරුද්ධ වාදයට නො පැමිණෙයි.


- **විමුත්තො** – මිදුනේ; සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දැන මිදුනේ, සියලු සංස්කාරයෝ දුක යැයි දැන මිදුනේ,
- **විවාදමෙති** - විවාදයට නොපැමිණෙයි, කලහ නොකරයි.

**භවාභවාය න සමෙති ධීරො** - බුද්ධමුනි තෙම භව, විභව මුණගැසීමට නොයයි.


- **භවාභවාය** –කාමභව, රූප භව, අරූප භව. පෘථජ්ජනයන් මෙම භවයන්ට පුන පුනා යයි.
- **ධීරො** – නුවණැතිතෙම. බුද්ධමුනි තෙම භව, විභව මුණගැසීමට නොයයි..

# ලෝභය කෙසේ ඇතිවන්නේද?

මනාපික අරමුණ -> සුඛ වේදනීය ස්පර්ශය -> සුඛ වේදනාව -> සොම්නස් සිතුවිලි. මේ වනවිට වට 4 ක් ගොස් ඇති අතර සංකල්ප හටගෙන අවසානය.




- පස්වෙනි වටය දී ලාභය නිසා චේතනා අගය දීම සිදුවේ.
- හයවෙනි වටය දී නන්දිය නිසා චේතනා අගය දීම සිදුවේ.
- දැන් අපි මෙම අගයන්ට අනුව භවය පැවැත්වීමට උත්සාහ කරනවා.




අපි කොපමණ වට කැරකුවත් මෙය පැවැත්විය නොහැක.

- කරකවන්න කරකවන්න ජරාවට යන එක වැඩිවෙනවා. ක්ෂේත්‍ර 2 (area2) සහ සරසඞ්කප්ප ක්ෂේත්‍ර යන ක්ෂේත්‍රයන් අතර පරතරය වැඩිවේ.


හත්වෙනි වටය දී ධර්මය නිසා චේතනා අගය දීම සිදුවේ.

- භවය පැවැත්වීම සඳහා ඉංජිනේරු විද්‍යාව, පරිගණක විද්‍යාව, වෛද්‍ය විද්‍යාව යන ආදියට අගය දෙනු ලබයි.

අටවෙනි වටය දී පෙර චේතනා නිසා චේතනා අගය දීමත්, මාන අගය දීමත් සිදුවේ.
සංස්කාර වලට අගය දී මාන වූ බව සිහි කරන්න. දැන් එම මානයට අගය දීම සිදුවේ.

එහි ප්‍රථිපලයක් වශයෙන් ප්‍රපඤ්චයෝ ඇති වේ.

- සංකල්පය ලකුණුකර ඇති පාර වඩා කැමතිවේ.




- රතු පාටින් ලකුණු කර ඇති දිට්ඨි පථය වේදනාව දක්වා පැමිණෙන්නේ ගැටුම් වලට තුඩුදේ.

මෙම ධර්මතාවය වටහා ගැනීමෙන් පිරිසුදු මනසක් ඇතිවේ.